museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2023 පෙබරවාරි

# ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ සන්දේව් හැන්ඩි සහ රිචෙල් මාසලින් සිංගප්පූරු කලා කෞතුකාගාරයේ නේවාසික වැඩසටහනකට සහභාගීවෙයි.

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ (MMCA ශ්‍රී ලංකා) අභිරක්ෂක සන්දේව් හැන්ඩි සහ සහාය අභිරක්ෂක රිචෙල් මාසලින් 2023 ජනවාරි 10 සිට පෙබරවාරි 6 දක්වා සිංගප්පූරු කලා කෞතුකාගාරයේ EX-SITU: Art Spaces Residency නම් නේවාසික වැඩසටහනට සහභාගීවිය.

සිංගප්පූරු කලා කෞතුකාගාරය මෙම නේවාසික වැඩසටහන හඳුන්වාදී ඇත්තේ 'වර්තමාන ගෝලීය කතිකාවන්ට ප්‍රතිචාර දක්වන, නව්‍ය කලාත්මක හා අභිරක්ෂණ ක්‍රියාවලි සංවර්ධනයට සහායවීමට කැපවූ කෞතුකාගාර වැඩසටහනක්' ලෙස ය. ඔවුන්ගේ නේවාසික පුහුණුව අතරතුර, හැන්ඩි සහ මාසලින් වත්මන් පසුකොන කෞතුකාගාර පිළිවෙත්, ප්‍රදර්ශන නිර්මාණයකිරීමේ උපායමාර්ග, සහ සිංගප්පූරු කෞතුකාගාර සන්දර්භයේ ඉදිරි ආයතනික සහ අධ්‍යාපනික ගමන් පිළිබඳව අවධානය යොමුකළේ, ශ්‍රී ලංකාවේ වැඩෙමින් පවතින කලා කෞතුකාගාරයකට ඉන් උකහා ගත හැකි දෑ පිරික්සීමට ය. තව ද, එකතු කළමනාකරණයට අවශ්‍ය පුහුණුව සහ අග්නිදිග ආසියාවේ පවතින කතිකා ශ්‍රී ලංකාවේ සහ මුළු දකුණු ආසියාවේ ම කතිකා සමග සම්බන්ධකරන අභිරක්ෂණ පර්යේෂණ පැවැත්වීම, සහ ප්‍රේක්ෂක නියැළීම සම්බන්ධයෙන් නව ප්‍රවේශ ඉගෙනීම සහ කෞතුකාගාර සඳහා කාර්ය ප්‍රවාහ හා සුදුසු පිළිවෙත් වර්ධනයකිරීම කෙරෙහි ද ඔවුහු අවධානය යොමුකළහ.

“මහජන ප්‍රතිලාභය සඳහා කැපවුණු තිරසාර ආයතන ගොඩනැගීමට සහ වර්ධනයකිරීමට අවශ්‍ය දෑ අවබෝධ කරගැනීමට සිංගප්පූරුවේ ගෙවූ කාලය ඉතා වැදගත්වුණා. දිගුකාලීන දැක්මක් ගොඩනැගීම, කැපවූ කණ්ඩායමක් වර්ධනයකිරීම හා පුහුණුකිරීම සහ, අනාගත ව්‍යාපෘති දක්වා වර්ධනයවීම සඳහා ආයතනයක් ව්‍යුහාත්මකව සූදානම්කිරීමට වසර ගණනක් ඉදිරියට සැලසුම්කිරීම වැනි විශාල අදහස්වල යාන්ත්‍රණ මම ඉගෙනගත්තා” යැයි මාසලින් කීවේ ය. ඔහු තවදුරටත් පැවසුවේ, “පසුකොන ක්‍රියාවලි, කාල සටහන්,

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

සහ අයවැය වැනි අත්‍යාවශ්‍ය කුඩා අංශ පිළිබඳ පුහුණුව හුඟක් ප්‍රයෝජනවත්වුණා. විශේෂයෙන් ම, අත්හදා බැලීමට බිය නොවීමේ වැදගත්කම මට Ex-Situ නේවාසික වැඩසටහන පෙන්වා දුන්නා" යනුවෙනි.

සිංගප්පූරු ජාතික කලා ගැලරිය, සිංගප්පූරු කලා කෞතුකාගාරය, උරුම සංරක්ෂණ මධ්‍යස්ථානය, ජාතික ලේඛනාගාරය, ජාතික කෞතුකාගාරය, හා STPI: Creative Workshop and Gallery වැනි ආයතන සහ, Hot House, Aliwhal කලා මධ්‍යස්ථානය, OH! Open House, හා Kult Kafe වැනි ස්වාධීන කලා අවකාශ හැන්ඩි සහ මාර්සලින්ගේ ගමන්වලට ඇතුළත්විය. එමෙන් ම ඔවුන් ෆර්හාන් ඉඩ්රිස් සමග පුන්ගොල් හරහා පා ගමනකට ද, සිංගප්පූරු ජාතික ගැලරියේ සහ සිංගප්පූරු කලා කෞතුකාගාරයේ අධ්‍යක්ෂක යූජීන් ටෑන් සමග හමුවකට ද, ශබීර් හුසේන් මුස්තාෆා සමග Residency Thursday Talkහි කතාබහකට ද එක්විය. ඔවුහු සිංගප්පූරු කලා සතියේ උත්සව, ප්‍රදර්ශන, ගැලරි, සහ කතා මෙන් ම සිංගප්පූරු දෙවස් උළෙලේ ප්‍රදර්ශන නැරඹීමට ද ගියහ.

"මම සිංගප්පූරුවේ ගතකළ කාලය මූලිකව ම ගෙවුනේ සමකාලීන කලා සහ සංස්කෘතික ක්ෂේත්‍රවලට අරමුදල් සැපයීමේ වැදගත්කම සහ, අනාගතයේ රට වෙනුවෙන් ඒවා ඉටුකරන කාර්යභාරය රාජ්‍ය හා පෞද්ගලික ආයතන හඳුනාගැනීම ශ්‍රී ලංකාවට කෙතරම් තීරණාත්මක ද යන්න ඉගෙනගනිමින්" යැයි පැවසූ හැන්ඩි, "ඒ කාලය තුළ අග්නිදිග ආසියාවේ කලාශිල්ප හරහා කෙරෙන සංවාද සහ හුවමාරු සහිත සාරවත් සංස්කෘතිය මා දුටු අතර, දකුණු ආසියාවේ එවැනි සංවාදයක් ඇතිකිරීමේ පමණක් නොව දකුණු ආසියාව සහ අග්නිදිග ආසියාව අතර කතිකා ඇතිකිරීමේ වැදගත්කම ද මා වටහාගත්තා" යැයි තවදුරටත් පැවසී ය.